54781

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
**Year End Evaluation**

22-11-2016

| ශ්‍රේණිය / தரம் / Grade | විෂයය / பாடம் / Subject | පත්‍රය / வினாத்தாள் / Paper | කාලය / காலம் / Time |
|---|---|---|---|
| 08 | ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා | I,II | පැය 02 |

නම :- .......................................................................... විභාග අංකය :- ........................

සැලකිය යුතුයි:

- ලිඛිත ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 50ක් හිමිවන අතර, ඉතිරි ලකුණු 50, වර්ෂය තුළ දී සිදුකරන ලද පාසල් පාදක ඇගයීම මත ලබාදෙනු ඇත.
- ප්‍රශ්න පත්‍රය I කොටස හා II කොටස්වලින් සමන්විතය. පළමුවන කොටසේ සියලුම ප්‍රශ්නවලටත්, දෙවන කොටසින් ප්‍රශ්න හතරකට පමණක් ද පිළිතුරු සපයන්න.

## I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ගොවියාගේ හිත මතුරෙක් ලෙස සැලකිය හැකි සත්ත්වයෙක් වනුයේ,
(1) වේයා ය. (2) කුහුඹුවා ය.
(3) ගොයම් මැස්සා ය. (4) ගැඩවිලා ය.

(02) අච්චාරු, චට්නි හා සෝස් වර්ග සෑදීමේ දී, වැඩි වශයෙන් භාවිත කරනු ලබන අම්ලය කුමක් ද?
(1) ඇසිටික් අම්ලය (2) සිට්රික් අම්ලය
(3) ලැක්ටික් අම්ලය (4) හයිඩ්‍රොක්ලෝරික් අම්ලය

(03) ඉදිකිරීම් ක්ෂේත්‍රය ආශ්‍රිතව යොදා ගන්නා පසු නිමහම් ද්‍රව්‍යයකි,
(1) ඉමල්ෂන් තීන්ත (2) ඉනැමල් තීන්ත
(3) විසුරුම් තීන්ත (4) මල නිවාරණ තීන්ත

(04) නාගරික කෘෂිකර්මයේ දී, බෝග වගා රාක්කවල සාර්ථකව වගා කළ හැකි බෝගයකි,
(1) වම්බටු (2) බණ්ඩක්කා (3) කංකුං (4) බතල

(05) ශාකයක මලෙන් ලබාගන්නා කුළුබඩු විශේෂයකි,
(1) සාදික්කා (2) කරාබුනැටි (3) කරඳමුංගු (4) ඉඟුරුපියලි

(06) ලාභය කොටස්කරුවන් අතර බෙදා දෙන, පැවැත්ම ස්ථිර සහ ලියාපදිංචිය අනිවාර්ය ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,
(1) සංස්ථා ය. (2) දෙපාර්තමේන්තු ය.
(3) හවුල් ව්‍යාපාර ය. (4) පොදු සමාගම් ය.

(07) මාළු ඇඹුල්තියල් සෑදීම සඳහා යොදා ගන්නේ,
(1) දෙහි, ලුණු, මාළු හා ගම්මිරිස් ය.
(2) ගොරකා, ලුණු, ගම්මිරිස් හා මාළු ය.
(3) ලුණු, සියඹලා, ගම්මිරිස් හා මාළු ය.
(4) විනාකිරි, ලුණු, ගම්මිරිස්, හා මාළු ය.

(08) නිවසේ ළිඳ අසල හෝ මුළුතැන්ගෙයින් ඉවත්වන ජලය බැස යන ස්ථාන, ක්‍රමවත්ව සකස් කිරීමෙන් සිටුවිය හැකි බෝග වන්නේ,
(1) කංකුං, කොහිල හා නිරමුල්ලිය ය.
(2) කොහිල, පොල්පලා හා රම්පේ ය.
(3) මුකුණුවැන්න, ගොටුකොළ හා පොල්පලා ය.
(4) කොහිල, කරපිංචා හා කංකුං ය.

(09) ව්‍යාපාර සංවිධාන බිහිවීමට තුඩුදෙන ප්‍රධාන හේතුව වන්නේ,
(1) ආරම්භ කිරීම ඉතා පහසු නිසා ය.
(2) මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා ය.
(3) මිනිසාට අවශ්‍ය භාණ්ඩ සේවා සැපයීම සඳහා ය.
(4) පාරිභෝගිකයාට අවශ්‍ය සේවා සැපයීම සඳහා ය.

(10) මේස විදුලි පංකාවක් අලුත්වැඩියා කිරීමේ දී පළමුව කළ යුතු වන්නේ,
(1) රෙගියුලේටරයේ කොටස් ගැලවීම ය.
(2) විදුලි පංකාවේ පෙති ගැලවීම ය.
(3) කුඩා ඉස්කුරුප්පු නියනකින් ඉදිරිපස ආවරණ දැල ඉවත් කිරීම ය.
(4) සුළං පෙත්ත හා එහි කොටස් පින්සලයකින් පිරිසිදු කිරීම ය.

(11) සාමාජිකයින්ගේ මුදල්වලින් ප්‍රාග්ධනය උපයා ගන්නා ස්වේච්ඡා සංවිධානයකි,
(1) අවිධිමත් ව්‍යාපාර
(2) පොදු සමාගම්
(3) හවුල් ව්‍යාපාර
(4) සමූපකාර ව්‍යාපාර

(12) මාෂ බෝග වර්ග කිහිපයක් වන, මුං කව්පි හා සෝයා බෝංචි අයත් ශාක කුලය,
(1) සොලනේසියේ වේ.
(2) මැල්වේසියේ වේ.
(3) ලෙගියුමිනේසියේ වේ.
(4) කුකර්බිටේසියේ වේ.

(13) උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය පාලනය කර, ආහාර තුළ ඇති ජලය ඉවත් කිරීමෙන්, ආහාර පරිරක්ෂණය කෙරෙන ක්‍රියාවලිය හඳුන්වන්නේ,
(1) අධි ශීතනය ලෙස ය.
(2) විජලනය ලෙස ය.
(3) බ්ලාන්ච් කිරීම ලෙස ය.
(4) ශීතනය ලෙස ය.

(14) නිෂ්පාදනයක, පොදු කාර්ය වියදම් පමණක් අඩංගු පිළිතුර කුමක් ද?
(1) විදුලි වියදම්, අමුද්‍රව්‍ය වියදම් හා වරිපනම්
(2) ද්‍රව්‍ය පිරිවැය, ශ්‍රම පිරිවැය හා වෙනත් වියදම්
(3) ගෑස් වියදම්, අමුද්‍රව්‍ය වියදම් හා ශ්‍රම වියදම්
(4) ගෑස් වියදම්, විදුලි වියදම් හා වෙනත් වියදම්

(15) බඳුන්ගත වගාව සඳහා වගා මාධ්‍යය සකස් කෙරෙන අනුපාතය වන්නේ,
(1) හලන ලද මතුපිට පස් කොටස් 1 : කාබනික පොහොර කොටස් 1යි.
(2) කාබනික පොහොර කොටස් 1 : හලන ලද මතුපිට පස් කොටස් 2යි.
(3) හලන ලද මතුපිට පස් කොටස් 1 : කොහුබත් කොටස් 2යි.
(4) හලන ලද මතුපිට පස් කොටස් 1 : කාබනික පොහොර කොටස් 2යි.

(16) රියම් භාවිතයෙන් කරන මෘදු පෑස්සීමක දී, ඔබ පළමුවෙන් ම කළ යුතු වන්නේ,
(1) විදුලි පාහනය රත් කිරීම ය.
(2) පාස්සන ස්ථානය රත් කිරීම ය.
(3) උපාංග අග්‍ර ගැට ගැසීම ය.
(4) පෑස්සුම් ස්ථානය හා අග්‍ර පිරිසිදු කිරීම ය.

(17) වගකීම අසීමිත වන, ව්‍යාපාර සංවිධාන වන්නේ,

(1) හවුල් ව්‍යාපාර හා ඒක පුද්ගල ව්‍යාපාර ය.
(2) හවුල් ව්‍යාපාර හා පොදු සමාගම් ය.
(3) පොදු සමාගම් හා පෞද්ගලික සමාගම් ය.
(4) සමූපකාර හා හවුල් ව්‍යාපාර ය.

(18) බ්ලාන්ච් කිරීම මගින් සිදුවන්නේ,

(1) සියලුම ක්ෂුද්‍ර ජීවීන් විනාශ වී යාම ය.
(2) ආහාරයට ක්ෂුද්‍ර ජීවීන් ඇතුළුවීම වැළැක්වීම ය.
(3) එන්සයිම අක්‍රීය වී, දුඹුරු පැහැවීම වැළැක්වීම හා ඇතැම් ක්ෂුද්‍ර ජීවීන් විනාශ වීම ය.
(4) ආහාරයේ අඩංගු ජල ප්‍රමාණය අඩුවීම ය.

(19) අප සතුව දුරකථන සම්බන්ධතාවයක් නොමැති විට, පරිගනකය භාවිත කර අන්තර්ජාලයට සම්බන්ධ වීම සඳහා භාවිතයට ගත හැකි ආදේශ උපකරණයකි,

(1) මොනිටරය
(2) ස්කෑනර් යන්ත්‍රය
(3) C.P.U (මධ්‍ය සැකසුම් ඒකකය)
(4) ඩොන්ගල් උපකරණය

(20) බෝග අස්වැන්න ලෙස බීජ, පත්‍ර, මුල් හා ඵල යන කොටස් ලබා ගන්නා බෝග වර්ග අනුපිළිවෙලින් දක්වෙන පිළිතුර තෝරන්න.

(1) මිරිස්, කෝපි, අර්තාපල් හා පොල්
(2) කෙසෙල්, තේ, කැරට් හා රාබු
(3) වී, තේ, කැරට් හා වට්ටක්කා
(4) වී, තේ, ගොටුකොළ හා කව්පි

(ලකුණු 1 x 20 = 20)

## II කොටස

- ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

(01) (අ) ඔබේ පන්ති කාමරය ඉදිරිපිට සිටුවිය හැකි, කෙටි කාලීන මල් වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 1/2)

(ආ) බොහෝ නිවෙස්වල බහුලව වගා කෙරෙන, වෙළෙඳාම පිණිස ද වගා කළ හැකි, සෙවන ප්‍රියකරන, මල් පිපෙන ශාකයක් නම් කරන්න. (ලකුණු 01)

(ඇ) කෙටි කාලීන මල් වගා කිරීමෙන් අපට අත්වන ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 02)

(ඈ) A, B, C, D යනු සිටුවීමට යොදා ගන්නා රෝපණ ද්‍රව්‍ය වේ. පහත වරහන් තුළ දී ඇති ලැයිස්තුවෙන්, එම රෝපණ ද්‍රව්‍යවලට උදාහරණ දෙක බැගින් තෝරා, A, B, C හා D ඉදිරියෙන් පිළිතුරු පත්‍රයේ ලියන්න.

A දඬු කැබලි - 1. .................................. 2. ..................................
B බීජ - 1. .................................. 2. ..................................
C කුඩා පැළ - 1. .................................. 2. ..................................
D පත්‍ර - 1. .................................. 2. ..................................

(බිගෝනියා, කපුරු, දාස්පෙතියා, රෝස, පෙපරෝමියා, ක්‍රෝටන්, සීනියාස්, බාබන්ඩේසියා)

(ලකුණු 04)

(02) (අ) ආහාර සඳහා භාවිත කෙරෙන අමුද්‍රව්‍ය, තෙත්ව කැබලි කර ගැනීමට හා තෙත්ව කුඩු කර ගැනීමට, භාවිත කරනු ලබන උපකරණ තුනක් නම් කරන්න. (ලකුණු 1 1/2)

(ආ) පිටි මෝලි සෑදීමේ දී, පිපුම්කාරක ලෙස භාවිත කෙරෙන ද්‍රව්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ඇ) දියාරු පිටි මිශ්‍රණ හා ඝන පිටි මෝලි භාවිතයෙන් සාදනු ලබන ආහාර වර්ග දෙක බැගින් ලියන්න. (ලකුණු 02)

(ඈ) "ඇසුරුම්කරණයේ දී, ලේබල් කිරීම ඉතා වැදගත් ය." ලේබලයක අඩංගු විය යුතු කරුණු හතරක් ලියන්න. (ලකුණු 02)

(03) (අ) විදුලි පාහනයකින් පෑස්සීම සඳහා භාවිත කෙරෙන පාහන ද්‍රව්‍යයක් නම් කරන්න. (ලකුණු 01)

(ආ) ආහාර පිසීම සඳහා භාවිත කෙරෙන උඳුන් වර්ග 3ක් සඳහන් කරන්න. (ලකුණු 1 1/2)

(ඇ) පහත වරහන් තුළ දී ඇති වචන උපයෝගී කරගෙන, A, B, C, D, E වලට අදාළ හිස්තැන් පුරවන්න.

A. ඉලෙක්ට්‍රොනික උපාංග එකලස් කර ගැනීමට අවශ්‍ය වේ. } ..............................

B. විදුලි රැහැනේ කෙළවර බාහිර ආවරණය, අවශ්‍ය ප්‍රමාණයට ඉවත්කර ගැනීමට උපකාරී වේ. } ..............................

C. විදුලි ධාරාවේ අගය මැනීම සඳහා භාවිත කෙරෙන සම්මත ඒකකය. } ..............................

D. ඉලෙක්ට්‍රොනික පරිපථ තුළින් නිපදවන සංඥා, ශබ්ද බවට පරිවර්තනය කිරීමට අවශ්‍ය උපාංගයකි. } ..............................

E. ප්‍රතිරෝධය මැනීමට භාවිත කෙරෙන ඒකකය. } ..............................

(ස්පීකරය, ඕම්, කපන අඬුව, විදුලි පාහනය, ඇම්පියර්) (ලකුණු 05)

(04) (අ) අලෙවි ප්‍රවර්ධන ක්‍රම පිළිබඳව පාරිභෝගිකයින් දැනුවත් කිරීම සඳහා යොදා ගන්නා උපක්‍රම තුනක් ලියන්න. (ලකුණු 1 1/2)

(ආ) ව්‍යාපාරිකයෙකුට, මුදල් ආයෝජනය කළ හැකි මාර්ග දෙකක් ලියන්න. (ලකුණු 02)

(ඇ) එක්තරා නිෂ්පාදකයෙකුට පැටිස් 1000ක් නිෂ්පාදනය කිරීම සඳහා දැරීමට සිදුවන වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය සඳහා | රු. 7000/= |
| ගෑස් හා විදුලිය | රු. 700/= |
| වෙනත් වියදම් | රු. 1300/= |

පැටිස් එකක් සෑදීමට ශ්‍රමික ගාස්තුව රු. 2/= කි.

ඉහත කරුණු ඇසුරින්,

(1) සෘජු ශ්‍රම පිරිවැය,

(2) වක්‍ර පිරිවැය හෙවත් පොදු කාර්ය පිරිවැය,

(3) මුළු නිෂ්පාදන පිරිවැය,

(4) නිෂ්පාදන ඒකක පිරිවැය, ගණනය කරන්න. (ලකුණු 04)

ප්‍රායෝගික තාක්ෂණික කුසලතා
8 ශ්‍රේණිය. 54801 22.11.2016

(05) (අ) නරක් වූ ආහාරයක ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 1 1/2)

(ආ) ආහාර නරක් නොවී කල්තබා ගැනීමට, අනුගමනය කෙරෙන පරිරක්ෂණ ක්‍රම හතරක් ලියන්න. (ලකුණු 02)

(ඇ) සමහර එළවළු කැපීමේ දී, දුඹුරු පැහැවීම සිදු වේ. එය වළක්වා ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 02)

(ඈ) වියළාගත් එළවළු කුඩු කර, අසුරා ගැනීමෙන්, සුප් මිශ්‍රණ සඳහා භාවිත කළ හැකිය. එහි වාසි දෙකක් ලියන්න. (ලකුණු 02)

(06) (අ) නිර්පාංශු වගාව සඳහා යොදා ගනු ලබන වගා මාධ්‍යයක නාමක් සඳහන් කරන්න.

(ලකුණු 1/2)

(ආ) බීජ තවාන් කර, පැළ ලබා ගත හැකි බෝග වර්ග දෙකක් හා වගා ක්ෂේත්‍රයේ කෙළින්ම සිටුවිය හැකි බෝග වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ඇ) වල් පැළ පාලනය සඳහා බහුලව යොදා ගන්නා ක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 02)

(ඈ) මනාව සකස් කර ඇති ගෙවත්තක දැකිය හැකි මූලික ලක්ෂණ තුනක් ලියන්න.

(ලකුණු 03)

Learning Resource Center
R
De Mazenod College